**ශීර්ෂය - 201 - බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

**ශීර්ෂය 201 -** බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2024 ජුනි 11 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 අගෝස්තු 22 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 66 යටතේ වැය විෂයයන් 04 ක් සඳහා ප්‍රතිපාදිත රු.68,451,000කින් රු.29,205,412ක් ඉතිරි වී තිබුණු අතර එම ඉතිරිය සියයට 26 ත් සියයට 63 ත් අතර පරාසයක් ගෙන තිබුණි. | මු.රෙ.66 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම් කළද අපේක්ෂිත පරිදි ඉල්ලීම් ඉදිරිපත් නොවීම නිසා මෙම ඉතිරිවීම් සිදු වී තිබූ බව දන්වා තිබුණි. | ඇස්තමේන්තු ප්‍රතිපාදන. ප්‍රමාණවත් නොවන බව තහවුරු කර ගැනීමෙන් පසු ප්‍රතිපාදන මාරු කිරීම සඳහා කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතාවය හේතුවෙන් වැය විෂයයන් 06 ක් සඳහා වාර්ෂික අයවැය ප්‍රතිපාදනය සහ මුළු ශුද්ධ ප්‍රතිපාදනය අතර විචලතාවය මූලික ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 61 ක සිට සියයට 525 ක් දක්වා පරාසයක් තුළ පැවතුණි. | රටේ පැවැති තත්ත්වයන් සහ වියදම් කළමනාකරණය සම්බන්ධ භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව කටයුතු කිරීම, ඇතැම් වැය විෂයයන්ට අමතර ප්‍රතිපාදන සලසා ගත යුතු වීම, බොහෝ භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යාමේ තත්ත්වය යටතේ අයවැය ඇස්තමේන්තුව මඟින් ලබා දී ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම යනාදී හේතු නිසා මූලික ඇස්තමේන්තුව සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර විචලතාවයන් ඇතිවූ බව දන්වා තිබුණි. | හැකිතාක් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු වේ. |
| (ඇ) | බෞද්ධ විශ්වකෝෂ මුද්‍රණය සඳහා රු.මිලියන 05 ක පුනරාවර්තන ප්‍රතිපාදනය ද, ශාසනාරක්ෂක මණ්ඩලවලට පහසුකම් සැලසීම සඳහා රු.මිලියන 01 ක ප්‍රාග්ධනය ප්‍රතිපාදනය ද සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණු අතර බෞද්ධ විශ්වකෝෂ මුද්‍රණය සඳහා වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1.72 ක් වෙනත් වැය විෂයයක් සඳහා මාරු කර තිබුණි. | බෞද්ධ විශ්ව කෝෂයේ සුචි වෙළුම සකස් කිරීමේ කාර්යය අවසන් අදියරේ පැවති බැවින් එය පොතක් වශයෙන් මුද්‍රණය කිරීමට සහ කතෘ මණ්ඩලයේ වැටුප් ගෙවීම සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වෙන් වී තිබුණ ද උප කතෘ විශ්‍රාම යාම, නියෝජ්‍ය කතෘ විදේශගත වීම, ප්‍රධාන කතෘගේ කොන්ත්‍රාත් සේවා කාලය දීර්ඝ නොකිරීම යන කරුණු හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වූ බව දන්වා තිබුණි. | හැකිතාක් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු වේ. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවට අදාළ නොවන වැය විෂයය අංක 201-126-2-7-35-2401/12-**p** යටතේ රු.969,405 ක වටිනාකමකින් යුත් බැරකම්, 2023 දෙසැම්බර් 31 දිනට **SA** – 92 භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත තුළ ඇතුළත්ව තිබුණ ද, ඒ පිළිබඳව භාණ්ඩාගාරයට දැනුම් දී එම මුද්‍රිතය නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ වරද නිවැරදි කර ගැනීමට කටයුතු කරන ලෙස රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ට හා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ට පිටපත් සමඟ අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දන්වා ඇති බවත් නැවත විමසීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | අප්‍රමාදව භාණ්ඩාගාරයට දැනුම් දී භාණ්ඩාගාර මුද්‍රිතය නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

### 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදි සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාම පිළිබඳ වන සමාලෝචන වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | 2018 සිට 2023 වර්ෂය දක්වා විමසුම් සඳහා පිළිතුරු ලබා දී ඇති අතර බාහිර ආයතන වන විහාරස්ථාන හා දේවාල සම්බන්ධයෙන් වන විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීම ප්‍රමාද වී ඇති බවත් එම ආයතන වෙත සිහිකැඳවීම් ලිපිද ඉදිරිපත් කර ඇති අතර ඉදිරියේදී මෙම දුර්වලතා අවම කර ගැනීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.5, 4.4, 4.5, 4.6 සහ 6.3 වගන්ති | 288,844 | විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් වර්ෂ 01ත් 02ත් අතර කාලයක සිට අය විය යුතුව පවතින රු.174,454ක ණය ශේෂය හා මියගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් වර්ෂ 02ත් 03ත් අතර කාලයක සිට අය විය යුතුව පවතින රු.114,390 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශ්‍රාම ගිය නිළධාරින් ගෙන් අයවිය යුතු රු.35,690ක ණය මුදල විශ්‍රාම පාරිතෝෂිතයෙන් අයකර ගැනීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපි යොමු කර ඇති අතර රු.138,764ක මුදල 2024 මාර්තු 19 දින විශ්‍රාම වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කර ඇති බවත් මියගිය නිළධාරින්ගේ ණය මුදල් මරණ පාරිතෝෂික මුදලින් අය කර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව කටයුතු කරන බවත් දන්වා තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| • මුදල් රෙගුලාසි 104 (4) | - | අලාභ හානිය සිදු වු දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් 2022 වර්ෂයේ අනතුරට ලක් වු වාහන දෙකක් සම්බන්ධයෙන් හා කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ ලැප්ටොප් යන්ත්‍රයක් අස්ථානගත වීම සම්බන්ධයෙන් පූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමට පිළිවෙලින් මාස 02 ක්, මාස 05 ක් හා මාස 18 ක් ප්‍රමාද කර තිබුණි. | පරීක්ෂණ පැවැත්වීමේදි ඇති වූ ප්‍රමාදයන් හේතුවෙන් ප්‍රමාද වී තිබූ පූර්ණ වාර්තාව මේ වන විට ඉදිරිපත් කර ඇති බවත් ඉදිරියේදි එවැනි ප්‍රමාදයන් වළක්වා ගැනීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. . | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| • මුදල් රෙගුලාසි 1647 ආ) සහ 128(ඊ) | - | දෙපාර්තමේන්තුව සතු වාහන හා ඊට අදාළ උපකරණ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | මේ සඳහා 2024 වර්ෂයේ දී වාහන සමීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇති බව දන්වා තිබුණි. . | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ඒ ඒ අංශයන්හි බඩු වට්ටෝරු පොත්වල ඇතුළත් කර තිබූ භාණ්ඩ පැහැදිලිව හඳුනාගැනීමට හැකිවන පරිදි අනුක්‍රමික අංක, ලැබීම් නියෝග | අදාල භාණ්ඩ වර්ගවල අනුක්‍රමික අංක හා ලැබීම් නියෝග අංක ආදියේ තොරතුරු ඇතුළත් කිරීමට, වත්කම් කළමනාකරණය සහ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් වඩා විධිමත් | බඩු වට්ටෝරු පොත් නිවැරදිව සහ පැහැදිළිව පවත්වා ගෙන යා යුතු වේ. |

| | | |
|---|---|---|
| අංක ආදී තොරතුරු ඇතුළත් කර නොතිබීම හේතුවෙන් වෙනත් අංශ හා කාර්යාලවලට මාරු කිරීමේදී හා අළුත්වැඩියා කටයුතු සඳහා බැහැරට ගෙනයාමේදී භාණ්ඩවල අනන්‍යතාවය හා ආරක්ෂාව තහවුරු කර ගැනීමට අපහසු වී ඇති බව නිරීක්ෂණය විය. | ආකාරයෙන් පොත්පත් පවත්වාගෙන යාමට සහ ඒවායේ ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රමාණවත් විධිවිධාන යෙදීමට අංශ ප්‍රධානීන් විශේෂයෙන් දැනුවත් කිරිමට කටයුතු කරන බව දන්වා තිබුණි. | |

## 3.2 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වන අධිකාරිය වන රජයේ නිලධාරින්ගේ ඇප ආඥා පනත හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 881 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරියෙකු එකී තනතුරට පත් කළ දිනයේ සිට හෝ මාරු කළ දිනයේ සිට දෙමසක් ඇතුළත ඇප තැබීම කළ යුතු වුවත් ඇප තැබිය යුතු නිලධාරීන් 07 දෙනෙකුගෙන් ඇප මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇප තැන්පත් කර නොමැති නිලධාරින්ගේ ඇප මුදල් තැන්පත් කිරිමට කඩිනමින් කටයුතු කරන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1931 අංක 19 දරන විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථාන 254 න් සිද්ධස්ථාන 211 ක අනුමාන අයවැය වාර්තා ද, සිද්ධස්ථාන 244 ක අර්ධ වාර්ෂික ආදායම් වියදම් වාර්තා ද, ගෙන්වා ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. | 1931 අංක 19 දරන විහාර දේවාලගම් ආඥා පනත ප්‍රකාරව අදාල අයවැය වාර්තා ගෙන්වා ගැනිමට සිහිකැඳවීම් ලිපි යොමු කර ඇති බවත් 2024 වසරේ සිට මේ සම්බන්ධ අඩුපාඩු මඟ හරවා ගනිමින් සිද්ධස්ථාන වෙතින් අයවැය වාර්තා ගෙන්වා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් අදාළ අංශ ප්‍රධානියා දැනුවත් කර ඇති බවත් දන්වා තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව අනුමාන අයවැය වාර්තා සහ අර්ධ වාර්ෂික ආදායම් වියදම් වාර්තා ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මහානායක වාරිකාරාම ගොඩනැගිල්ල දෙපාර්තමේන්තුව විසින් ඉදි කර තිබුණ ද, අදාළ ඉඩමේ අයිතිය මෙම වාර්තාවේ දිනය වන විටත් දෙපාර්තමේන්තුව වෙත පවරා ගෙන නොතිබුණි. | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම් මැනුම් ගත කර අනුරේඛනයක් සකස් කර දෙන මෙන් ඉල්ලා කොළඹ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත අදාළ මැනුම් ඉල්ලීම් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කර ඇති බව දන්වා තිබුණි. | ගොඩනැගිල්ල ඉදි කර ඇති අදාළ ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | කැලණිය ඊරියවැටියේ දස සිල් මාතා මූලස්ථානය ඉදි කරන ලද ඉඩම, 2012 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට පූජ්‍ය වැලමිටියාවේ කුසලධම්ම නායක ස්වාමීන් වහන්සේගේ කැමැත්ත ප්‍රාදේශීය ලේකම්වරයා වෙත දැනුම් දී වර්ෂ 11 කට වැඩි කාලයක් ගත වුව ද මෙතෙක් ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර නීතිමය අයිතිය තහවුරු කර ගෙන නොතිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධව පිළියෙල කරන ලද හත්වන වගන්තිය යටතේ දැන්වීම දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ට පරිවර්තනය කර මේ වන විට රජය ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා රජයේ මුද්‍රණාලය වෙත බාර දී ඇති බව කැලණිය ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී ඇති බව දන්වා තිබුණි. | ගොඩනැගිල්ල ඉදි කර ඇති අදාළ ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | හිටපු නිලධාරියා ස්ථාන මාරුවී යාම හේතුවෙන් රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයේ සහකාර කොමසාරිස් තනතුරේ රාජකාරී ආවරණය කිරීම සඳහා 2022 නොවැම්බර් සිට පත්කළ සහකාර කොමසාරිස් (පාලන) වෙත ඊට අදාළ රාජකාරී කටයුතු සඳහා සතියකට දින 02 ක් සංචිතයේ වාහන භාවිතා කිරීමට අනුමැතිය ලබා දී තිබුණ ද ඔහු විසින් ඊට වැඩි දින ගණනක් සංචිතයේ වාහන සමඟ රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයට අනුයුක්ත වාහනය ද ධාවනයට යොදවා ගෙන තිබුණු අතර 2022 නොවැම්බර් සිට 2023 දෙසැම්බර් දක්වා සංචිතයේ වාහන කිලෝමීටර් 15,759 ක් ද, රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයට අනුයුක්ත වාහනය කිලෝමීටර් 7,978 ක් ද වශයෙන් කිලෝමීටර් 23,737 ක් ධාවනය සඳහා යොදවා ගෙන තිබුණි. | ඉන්ධන අරපිරිමැස්මෙන් භාවිතා කිරීම අරමුණු කරගෙන නිලධාරින් කිහිප දෙනෙකු සහභාගී වන රාජකාරී වැඩ සටහන් සඳහා හිටපු කොමසාරිස් ජනරාල් විසින් පොදුවේ වාහනයක් යොදා ගෙන අනිකුත් නිළධාරින් සමග රාජකාරී කටයුතු කර ඇති බවත් හිටපු සහකාර කොමසාරිස් (පාලන) විසින් සතියකට දින දෙකකට වඩා වැඩි දින ගණනක් සඳහා සංචිතයේ වාහන හා රත්නපුර හා ඒ අවට ධාවනය සඳහා වාහන භාවිතා කර ඇති බවත් පිළිගන්නා අතර මේ පිළිබඳව තවදුරටත් අදාළ නිලධාරියාගෙන් පෞද්ගලිකව පැහැදිලි කිරීම් හා තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | අනුමැතිය පරිදි සංචිත වාහන භාවිතා කිරීමටත් ඉන්ධන වියදම් පාලනය විධිමත් පරිදි සිදු කිරීමටත් කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ගෙන් බැහැරව තරහකාරී මිල කැඳවීමෙන් තොරව සිසු නිපුණතා ඇගයීම් වැඩසටහනේ චක්‍රලේඛ, ආකෘති පත්‍ර, ප්‍රවේශ පත්‍ර හා කාල සටහන් මුද්‍රණය කිරීම සඳහා රු.2,740,979ක් ද, ආරාධනා පත්‍ර මුද්‍රණය සඳහා රු.252,540ක් ද, සහතික පත්‍ර මුද්‍රණය කිරීම සඳහා රු.1,746,345ක් ද වශයෙන් එකතුව රු. 4,739,864ක මුද්‍රණ වියදම් දරා තිබුණු අතර ආරාධිත අමුත්තන් වෙත ආරාධනා කිරීම සඳහා ලිපි යවා තිබියදී උත්සවයට දින 2කට පෙර ආරාධනා පත්‍ර 1500ක් මුද්‍රණය කිරීමට රු.252,540ක නිශ්කාර්ය වියදමක් දරා තිබුණි.<br><br>තවද, අවශ්‍යවන සහතික පත්‍ර ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමෙන් තොරව වියදම රු.45,422 කින් අදියර තුන සඳහා සහතික පත්‍ර 2788ක් වැඩිපුර මුද්‍රණය කර තිබූ අතර එම වැඩි සහතික අවභාවිතාවීම සිදු විය හැකි බවද නිරීක්ෂණය විය. ඒ අනුව මෙම වැඩසටහන සඳහා අතිකාල හා ප්‍රවාහන වියදම් හැර දැරීමට සිදු වී තිබුණු වියදම රු.41,608,881ක් වී තිබුණි. | මුද්‍රණ දෙපාර්තමේන්තුව රජයේ ආයතනයක් බැවින් මු.රෙ 630 පරිදි මිල ගණන් කැඳවා අවශ්‍ය මුද්‍රණ කටයුතු සිදු කරන ලද බවත් දහම් පාසල් කොමසාරිස් වෙතින් තවදුරටත් පැහැදිලි කිරීම් හා තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි.<br><br>මෙම වැඩසටහන වෙනුවෙන් සහතික පත්‍ර මුද්‍රණය කිරීමේදී, එක් ප්‍රාදේශිය මණ්ඩලයක් සඳහා නිපුණතා ඉසව් 41 වෙනුවෙන්, මුල් ස්ථාන පහ සඳහා සහතික 205ක් අවශ්‍ය වුවත් සෑම මණ්ඩලයක් සඳහාම සහතික 210ක් ලබාදීම සිදු කරන බවත් අමතර සහතික ලබා දීමේදී අවශ්‍ය සහතික ප්‍රමාණය, වැරදි ලෙස ලියන ලද සහතික ලබා දී ඇති ප්‍රමාණය යන තොරතුරු ලබා ගැනීමෙන් පසු අමතර සහතික ලබා දිමට ඉදිරියේදි බලාපොරොත්තු වන බවත් එසේ අමතර සහතික පත් වෙනුවෙන් ලැබෙන ඉල්ලීම් වලදී එම දෝෂ සහිත සහතිකපත් ගෙන්වා ගෙන ඒ වෙනුවට නැවත සහතිකපත් නිකුත් කිරීම මෙවරද සිදු කරන බවත් දන්වා තිබුණි. | දහම් පාසැල් සිසු නිපුණතා සඳහා ප්‍රශ්න පත්‍ර, චක්‍රලේඛ, ප්‍රවේශ පත්‍ර සහ සහතික පත්‍ර මුද්‍රණය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව නිවැරදි ඇස්තමේන්තු මත සිදු කළ යුතු වේ. |
| (ඊ) | 2021 සහ 2022 වර්ෂවලට අදාළව දහම් පාසල් ශ්‍රේණි විභාග සඳහා ප්‍රශ්න පත්‍ර හා සහතික පත්‍ර මුද්‍රණය කිරීම සඳහා රු.40,203,680ක වියදමක් දරා තිබුණි. තවද, 2022 වර්ෂයේ ශ්‍රේණි විභාගවලට අයදුම් කළ සිසුන් සංඛ්‍යාව 832,875ක් වුවද ඊට වඩා ප්‍රශ්න පත්‍ර 165,609ක් හා එම විභාගවලට පෙනී සිටි 645,042 ක් වූ සිසුන් සංඛ්‍යාවට වඩා සහතික පත්‍ර 4,958ක් මුද්‍රණය කිරීමත්, 2021වර්ෂයේදී | මුද්‍රණ දෙපාර්තමේන්තුව රජයේ ආයතනයක් බැවින් මු.රෙ 630 පරිදි මිල ගණන් කැඳවා අවශ්‍ය මුද්‍රණ කටයුතු සිදු කරන ලද බවත් දහම් පාසල් කොමසාරිස් වෙතින් තවදුරටත් පැහැදිලි කිරීම් හා තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | සංඛ්‍යාත්මක තොරතුරු පිළිබඳ නිවැරදි දත්ත ලබාගෙන ඒ අනුව මුද්‍රණ කටයුතු සැලසුම් කිරීම තුළින් නිෂ්කාර්ය වියදම් වලක්වා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විභාගයට අයදුම් කළ සිසුන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු තබා නොගෙන මුද්‍රණය කර තිබුණු ප්‍රශ්න පත්‍ර 1,067,946කින් 428,578ක් සහ විභාගයට පෙනී සිටි 639,368ක් වූ සිසුන් සංඛ්‍යාවට වඩා සහතික පත්‍ර 35,632 ක් මුද්‍රණය කර තිබීමත් හේතුවෙන් රු.6,186,558ක නිෂ්කාර්ය වියදමක් ඇතිවී තිබුණි. | | |
| (උ) | ශ්‍රේණි විභාග සඳහා නිකුත් කරන සහතික පත්‍රවලින් ඉතිරිවන ප්‍රමාණය පිළිබඳව සංඛ්‍යා දත්ත තබාගෙන සාධාරණ කාලයකින් පසු ඉතිරි සහතික පත්‍ර ආපසු ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබීමෙන් සහතික පත්‍ර අවභාවිතා වීමේ ඉඩකඩක් පවතින බවට නිරීක්ෂණය විය. | ඉතිරි සහතික පත් සම්බන්ධයෙන් අවභාවිතයක් නොවන ආකාරයෙන් අපහරණය කිරීමට සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට දහම් පාසල් කොමසාරිස් වෙත උපදෙස් ලබා දුන් බව දන්වා තිබුණි. | ශ්‍රේණි විභාග හා සිසු නිපුනතා අවශ්‍යතා සඳහා නිකුත් කරනු ලබන සහතික පත්‍රවලින් ඉතිරිවන සහතික පත්‍ර ආපසු ගෙන්වා ගැනීම සඳහා නිසි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර සහතික පත්‍ර අවභාවිතා වීමේ හැකියාව වැලැක්වීමට කටයුතු කළ යුතු වේ. |
| (ඌ) | 2023 කාර්යසාධන වාර්තාව අනුව 2023 වර්ෂය අවසානය දක්වා දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කර තිබූ නඩු ලිපිගොනු 309 කින් අවසන් වී තිබුණු නඩු සංඛ්‍යාව 121 ක් පමණක් විය. | අධිකරණ කාර්යයන්ගේ ප්‍රමාදය මෙන්ම දෙපාර්තමේන්තුවේ නීති අංශයේ පවතින මානව සම්පත් හිඟය ද මේ කෙරෙහි බලපා තිබූ බව දන්වා තිබුණි. | නඩු කටයුතු කඩිනමින් අවසන් කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවෙන් ගත හැකි ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු වේ. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කර තිබූ විගණන විමසුම් 50 කට අදාලව නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පිළිබඳව තහවුරුවක් නොවුණි. | 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනයට අදාල විමසුම් සඳහා පිළිතුරු ලබා දී ඇති අතර බාහිර ආයතන වන විහාරස්ථාන හා දේවාල සම්බන්ධයෙන් වන විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීම ප්‍රමාද වී ඇති බවත් මේ සම්බන්ධයෙන් එම ආයතන වෙත සිහිකැඳවීම් ලිපි ඉදිරිපත් කර ඇති අතර ඉදිරියේදී මෙම දුර්වලතා අවම කර ගැනීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | අභ්‍යන්තර අංශ මෙන්ම බාහිර ආයතන වන විහාරස්ථාන හා දේවාල සම්බන්ධ විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සහකාර කොමසාරිස් (පාලන) විසින් රාජකාරී ආවරණය කරන රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයේ සහකාර කොමසාරිස් තනතුර පුරප්පාඩු වී මාස 19 කට වැඩි කාලයක් ගතවී තිබුණ ද, නිත්‍ය නිලධාරියෙකුගෙන් එම පුරප්පාඩුව පිරවීමට කටයුතු කර නොතිබුණි. | අදාළ පුරප්පාඩුව සම්පූර්ණ කරන ලෙස බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයතු අමාත්‍යාශයේ ලේකම් ද, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් ද දැනුවත් කර ඇති අතර පුරප්පාඩුව සම්පූර්ණ කිරීමට කටයුතු කර ගෙන යමින් පවතින බව දන්වා තිබුණි. | කඩිනමින් පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ |
| (ආ) | 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ 848 ක් වූ අනුමත තනතුරු සංඛ්‍යාවෙන් තනතුරු 83 ක් පුරප්පාඩු වී පැවැති අතර ඒ තුළ අතිරේක කොමසාරිස් ජනරාල් ඇතුළු නියෝජ්‍ය හා සහකාර කොමසාරිස් තනතුරු 06 ක්, සංවර්ධන සහකාර තනතුරු 22 ක් සහ කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 13 ක් විය. | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පුරප්පාඩු සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ද දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පිළිබඳ වාර්තාවක් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත ද යොමු කර ඇති බව දන්වා තිබුණි. දෙපාර්තමේන්තුගත තනතුරු වන බෞද්ධ කටයුතු සමායෝජක සහ සංවර්ධන සහකාර යන තනතුරු දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර ඇති බැවින් නව බඳවා ගැනීම් සිදු කරනු නොලබන බවත් එම නිලධාරින් සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වීම අනුව අහෝසි වනු ඇති බවත් කළමනාකරණ සේවා නිලධාරින්ගේ පුරප්පාඩු සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කරමින් නව බඳවා ගැනීම් සිදු කරන විට මෙම දෙපාර්තමේන්තුව වෙත ද අනුයුක්ත කරන ලෙස ඉල්ලා ඇති බවත් දන්වා තිබුණි. | කඩිනමින් පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 05 ක් එකම සේවා ස්ථානයෙහි සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩ දීම සඳහා ස්ථාන මාරු ලබා දිය යුතු වුවත් දෙපාර්තමේන්තුව තුළ වර්ෂ 05 ක සිට වර්ෂ 18 කට වැඩි කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන් 371 දෙනෙකු සඳහා ස්ථාන මාරු ලබාදීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට මෙම දෙපාර්තමේන්තුවේ වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු නියෝග නිකුත් කර ඇති අතර 2024 මැයි 02 දින සිට ක්‍රියාත්මක කර ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ස්ථාන මාරු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. |